# දඹුලු විහාරය ලෝක උරුමයක් වීමට බලපෑ හේතු සාධකවල වත්මන් තත්ත්වය පිළිබඳ විමර්ශනයක්

**ජයතිලක.ආර්.ඒ.ටී.එම්,[1] ඉලංගරත්න.පී.පී.එන්.එල්.[2]**

ඓතිහාසික දඹුලු විහාරය යනු අතීතයේ ජම්බුකෝල නමින් හැඳින්වූ ශ්‍රී ලංකාවේ ඇති විශාලතම බෞද්ධ ලෙන් විහාරයයි. ද්‍රවිඩ ආක්‍රමණ හමුවේ වසර 14ක් සැඟව සිටි වළගම්බා රජුහට මෙහි ධ්‍යාන පුරමින් සිටි භික්ෂූන් වහන්සේලා රැකවරණය සැපයූහ. වළගම්භා රජු නැවත රජයට පැමිණ භික්ෂූන් වහන්සේලාට කළගුණ සැලකීමක් වශයෙන් දඹුලු විහාරය කරවා ඇත. පසුකල නිශ්ශංකමල්ල රජු ලෙන පිළිසකර කර පිළිමවල රන් ආලේප කර 'ස්වර්ණගිරි' නාමය ආරූඪ කළේය. 1991 දී යුනෙස්කෝව විසින් මෙම ලෙන් සංකීර්ණයෙහි ඇති වැදගත්කම සළකා එය ලෝක උරුමයක් බවට ප්‍රකාශ කරන ලදි. මෙය ලෝක උරුමයක් බවට පත්වීමට බලපෑ නිර්ණායකයන්හි ස්වරූපය හා වත්මනේ ඒවා කෙතෙක් දුරට ආරක්ෂා වී ඇද්දැයි විමසීම මෙම පර්යේෂණය මගින් සිදුවේ. එහිදී ක්ෂේත්‍රය ගවේෂණය කිරීමත්, පුස්තකාල පරිශීලනය මගින් ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය පිරික්සීමත් අධ්‍යයනය ක්‍රමවේදය ලෙස යොදා ගැනුණි. දඹුලු විහාරය සංස්කෘතික ලෝක උරුමයක් වීමට ලෝක උරුම නිර්ණායක 10න් 2ක් පාදක වී ඇත. එනම්, "මානව නිර්මාණාත්මක ප්‍රතිඵල විදහා දැක්වෙන අග්‍රගන්‍ය කලා නිර්මාණයක් වීම" හා "සාම්ප්‍රදායිකව පැවත එන සජීවී සම්ප්‍රදායක් හෝ සිදුවීම් අංග දක්වෙන ස්ථානයක් වීම" යන ඒවාය. දඹුල්ලේ ලෙන් සංකීර්ණය ලෝකයේ වඩාත් ප්‍රසිද්ධ වූයේ අලංකාර බුද්ධ ප්‍රතිමා, දේව ප්‍රතිමා, ගුහා බිත්තිවල සිතුවම් කර ඇති චිත්‍ර සහ දවමය පිළිම රාශියක් පැවතීම නිසාය. එම චිත්‍රවලින් බොහොමයක් 17-18 වන සියවස්වලට අයත් බව හඳුනාගෙන ඇත. දඹුලු විහාරය සාම්ප්‍රදායිකව පැවත එන මානව ක්‍රියාකාරකම් නිසා වන්දනීයත්වයට ලක්ව ඇති ස්ථානයකි. විශේෂයෙන් සැදැහවතුන් විසින් එහි ඇති බුදුපිළිම වන්දනාමාන කිරිම, එහි ඇති දේවාල වන්දනාමාන කිරීම හා විවිධ චාරිත්‍රානුකූල වතාවත් සිදු කිරීම අතීතයේ සිට පැවත එන්නකි. මේ හේතු සාධක දඹුල්ල විහාරය ලෝක උරුමයක් බවට පත්වීමට බලපා ඇති අතර සංරක්ෂණය කිරීම, නඩත්තුව හා ආරක්ෂා කිරීම පැවරී ඇත්තේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදල වෙතය. නමුත් ලෙන් විහාරයේ සිතුවම් හා පිළිම විනාශ වීම, බෝහෝ කලකින් එහි සංරක්ෂණ කටයුතු සිදු නොවීම, නඩත්තු කටයුතුවල ඇති වන විවිධ ගැටලු, එහි ඇති ඓතිහාසික අගයන්ට හානි වන ලෙස නව ඉදිකිරීම් සිදුකිරීම යනාදිය නිසා ලෝක උරුම නිර්ණායකයන්හි රඳාපැවැත්ම ගිලිහෙමින් පවතී. දඹුල්ල ලෙන් ආරාමය ලෝක උරුම ලැයිස්තුවෙන් ඉවත් කළහොත් එහි ගොලීය වටිනානම නිශ්ප්‍රභ වනු ඇත. ඒ නිසා මේ පුදබිම රැක ගැනීම අප සැමගේ වගකීමක් වී ඇත.

**ප්‍රමුඛ පද :** දඹුලු විහාරය, ලෝක උරුමය, ලෝක උරුම ලැයිස්තුව

[1,2]ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. thilinamjayathilaka@gmail.com